# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2075/16 – 2018 ජුනි 11 වැනි සඳුදා – 2018.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පළාත සුළු කොට්ඨාසයේ, මීගහවෙල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක පීයූ/එන්ටීටී/2016/096 හා 2016.03.16 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0213ක් පමණ වන ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – අයි 92 – ප්‍රමාණය: හෙක්. 0.0213

උතුරට: මාර්ගය; නැගෙනහිරට සහ දකුණට: ගල්කැති දේවගේ නිර්මලා සරෝජනී ගරුසිංහ හිමිකම් කියන අයි 92; බටහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය:. 4-3/2/2015/එච්ඒ/295.
2018 අප්‍රේල් මස 06 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 965